



## චන්ද්‍රිකා දත්ත මත පදනම් වූ

# ටූනා මත්ස්‍යය බිම් පුරෝකතන සේවාව
# ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

---


ජාතික ජලජ සම්පත් පර්යේෂණ හා සංවර්ධන නියෝජිතායතනය

கடல்சார் கடல் அறிவியல் தேசிய நிறுவனம் தேசிய நீர்வள
ஆராய்ச்சி அபிவிருத்தி முகாமை




බහුදින යාත්‍රා සඳහා මසුන් ගැවසෙන ප්‍රදේශ පිළිබඳ පුරෝකථනය

## ஆழ் கடல் மீன்பிடித் தளங்களுக்கான எதிர்வு கூறல்

නිකුත්කල දිනය பிரசுரிக்கப்பட்ட திகதி : 2025-06-09

| අක්ෂාංශ அகலாங்கு | | | දේශාංශ நெட்டாங்கு | | | ගැඹුර ஆழம் |
|---|---|---|---|---|---|---|
| අංශක பாகை | මිනිත්තු கலை | | අංශක பாகை | මිනිත්තු கலை | | බඹ பாகம் |
| 13 | 2 | N | 88 | 21 | E | 54 |
| 10 | 44 | N | 86 | 3 | E | 46 |
| 10 | 18 | N | 85 | 0 | E | 41 |

Service credits: "Generated using E.U. Copernicus Marine Service Information. GMI data are produced by Remote Sensing Systems and sponsored by NASA Earth Science funding

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology
TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**<u>බහු දින යාත්‍රා සඳහා කාලගුණ අනාවැකිය</u>**
**<u>උතුරු අක්ෂාංශ 20 ත් දකුණු අක්ෂාංශ 10 ත් සහ නැගෙනහිර දේශාංශ 60 ත් 100 ත් අතර මුහුදු ප්‍රදේශ සඳහා</u>**
**<u>(2025 ජූනි මස 09 දින පෙ.ව. 07.00 ට ඉදිරි පැය 24 සඳහා නිකුත් කරන ලදි.)</u>**

**හෙට (10) දින සිට දිවයිනේ නිරිත දිග කොටසේ වැසි තත්වයේ වැඩි වීමක් සහ දිවයින හරහා සහ දිවයින වටා මුහුදු ප්‍රදේශවල විටින් විට හමන තද සුළං බලාපොරොත්තුවේ.**

**කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් නිකුත් කරනු ලබන ඉදිරි නිවේදන පිළිබඳව, අවධානයෙන් පසු වන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**

**දිවයින වටාවන මුහුදු ප්‍රදේශ**

| |
|---|
| **වැසි තත්ත්වය:** |
| පුත්තලම සිට කොළඹ සහ ගාල්ල හරහා හම්බන්තොට දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල තැනින් තැන වැසි ඇති වේ. මන්නාරම සිට කන්කසන්තුරය හරහා මුලතිව් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල ස්ථාන ස්වල්පයක සවස් කාලයේදී හෝ රාත්‍රී කාලයේදී වැසි හෝ ගිගුරුම් සහිත වැසි ඇති වේ. |
| **සුළඟ:** |
| සුළං නිරිත දිශාවෙන් හමා එයි.<br>හලාවත සිට පුත්තලම සහ මන්නාරම හරහා කන්කසන්තුරය දක්වා සහ ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය **පැ.කි.මී. (30-40)** පමණ වන අතර විටින් විට **පැ.කි.මී. (50-60)** පමණ දක්වා ඉහළ යා හැක.<br>දිවයින වටා වන සෙසු මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය පැ.කි.මී. **(25-35)** පමණ වේ.<br>හලාවත සිට කොළඹ හරහා ගාල්ල දක්වා සහ කන්කසන්තුරේ සිට මුලතිව් හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශවල සුළඟේ වේගය විටින් විට **පැ.කි.මී. (45-50)** පමණ දක්වා ඉහළ යා හැක. |
| **මුහුදේ ස්වභාවය:** |
| හලාවත සිට පුත්තලම සහ මන්නාරම හරහා කන්කසන්තුරය දක්වා සහ ගාල්ල සිට හම්බන්තොට හරහා පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශ විටින් විට රළු වේ. හලාවත සිට කොළඹ හරහා ගාල්ල දක්වා සහ කන්කසන්තුරේ සිට මුලතිව් හරහා ත්‍රිකුණාමලය දක්වා වන මුහුදු ප්‍රදේශ විටින් විට තරමක් රළු වේ.<br>හම්බන්තොට සිට පොතුවිල් දක්වා වෙරළට ඔබ්බෙන් වන මුහුදු ප්‍රදේශවල **මුහුදු රළ උස මීටර් (2.5-3.0) ක් පමණ** ඉහළ යාමේ හැකියාවක් පවතී.<br>**මේ පිළිබඳ සිය අවධානය යොමු කරන ලෙස ධීවර හා නාවික ප්‍රජාවගෙන් ඉල්ලා සිටිනු ලැබේ.**<br>**ගිගුරුම් සහිත වැසි ඇති වන විට එම මුහුදු ප්‍රදේශවල තාවකාලිකව තද සුළං ඇති විය හැකි අතර එවිට එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.** |

**<u>බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශය</u>**

**කාලගුණික තත්ත්වය:**

10 - 18N, 87E-100E : බොහෝ ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
EQ - 05N, 85E-100E : බොහෝ ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**

EQ - 05N, 85E-100E : නිරිත දෙසින් /පැ.කි.මී. (40-50) ; විටින් විට පැ.කි.මී. (60-70) දක්වා.
05N - 13N, 80E-100E : නිරිත දෙසින් /පැ.කි.මී. (30-40) ; විටින් විට පැ.කි.මී. (50-60) දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : නිරිත දෙසින් /පැ.කි.මී. (30-40).

කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
வளிமண்டலவியல் திணைக்களம்
Department of Meteorology

TP : 011 2686686
Fax : 011 2691443
E-mail : metnmc@gmail.com
Web : www.meteo.gov.lk

**මුහුදේ ස්වභාවය:**

EQ - 05N, 85E-100E : රළු සිට ඉතා රළු දක්වා.
05N - 13N, 80E-100E : මඳ වශයෙන් රළු සිට තරමක් රළු; විටින් විට රළු දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : මඳ වශයෙන් රළු.

<u>අරාබි මුහුද</u>

**කාලගුණික තත්ත්වය:**

EQ -15N, 70E-80E : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : ස්ථාන ස්වල්පයක වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

සුළං තත්ත්වය:

EQ - 10N, 70E-80E : වයඹ සිට බස්නාහිර දක්වා දිශාවලින් /පැ.කි.මී. (30-40) ; විටින් විට පැ.කි.මී.50 දක්වා.
10N - 20N, 70E-75E : වයඹ දෙසින් /පැ.කි.මී. (30-40)
සෙසු මුහුදු ප්‍රදේශ : නිරිත සිට බස්නාහිර දක්වා දිශාවලින් /පැ.කි.මී. (20-40).

**මුහුදේ ස්වභාවය:**

EQ - 10N, 70E-80E : තරමක් රළු ; විටින් විට රළු දක්වා.
10N - 20N, 70E-75E : මඳ වශයෙන් රළු.
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවයේ සිට මඳ වශයෙන් රළු දක්වා.

<u>දකුණු ඉන්දියානු සාගරය</u>

**කාලගුණික තත්ත්වය :**

EQ - 08S, 63E-72E : බොහෝ ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
EQ - 05S, 85E-100E : බොහෝ ස්ථානවල වැසි හෝ ගිගුරුම් සහිත වැසි.
සෙසු මුහුදු ප්‍රදේශ : තැනින් තැන වැසි හෝ ගිගුරුම් සහිත වැසි.

**සුළං තත්ත්වය:**

04S -10S, 83E-100E : නිරිත දෙසින් / පැ.කි.මී. (30-40) ; විටින් විට පැ.කි.මී. (50-60) දක්වා.
05S -10S, 60E-85E : ගිනිකොණ දෙසින් / පැ.කි.මී. (30-40) ; විටින් විට පැ.කි.මී.50 දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : ගිනිකොණ දෙසින් හෝ නිශ්චිත දිශාවකින් තොරව / පැ.කි.මී. (20-30).

**මුහුදේ ස්වභාවය:**

04S -10S, 83E-100E : මඳ වශයෙන් රළු සිට තරමක් රළු; විටින් විට රළු දක්වා.
05S -10S, 60E-85E : තරමක් රළු ; විටින් විට රළු දක්වා.
සෙසු මුහුදු ප්‍රදේශ : සාමාන්‍ය ස්වභාවයේ සිට මඳ වශයෙන් රළු දක්වා.

****ගිගුරුම් සහිත වැසි ඇති වන විට තද සුළං සමඟ එම මුහුදු ප්‍රදේශ තාවකාලිකව ඉතා රළු විය හැක.**